## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය - 2013

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 හා 2003 අංක 38 දරන පනත් මඟින් සංශෝධිත 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරිම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරිමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරිම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ප්‍රමිත අංක 02 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවේදන තැන්පතුවල ආයෝජනය කරන ලද රු.13,437,318 ක මුදල හා රු.3,250,000 ක නිවේදන තැන්පතු මුදල් කරගැනීම්, මුදල් හා මුදල් සමාන දෑ යටතේ නොපෙන්වා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ආයතනයේ අඩමාණ ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තියක් ගිණුම්කරණ සටහන්වල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

සේවකයෙකු සඳහා පාරිතෝෂික වෙන්කිරීම් රු.74,162 ක් අඩුවෙන් ගණනය කර තිබීම හේතුවෙන් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ආයතනයේ වාහන පැමිණීමේ හා පිටවීමේ වේලාවන් දැක්වෙන ගේට්ටු ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම හේතුවෙන් දේශන සඳහා පැමිණෙන අභ්‍යන්තර හා බාහිර සම්පත් දායකයන්ට ගෙවා තිබුණු රු.232,559 ක ප්‍රවාහන දීමනාවල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 අංක 38 දරන පනතින් සංශෝධිත 1979 අංක 45 දරන ජාතික වැව්ලි කළමනාකරණ ආයතන පනතේ 6 වගන්තිය | (අ) විෂය භාර අමාත්‍යවරයා විසින් පාලක සභාවට වෘත්තීය සමිති නියෝජනය කරන සාමාජිකයන් දෙදෙනා පත්කර නොතිබුණි.<br><br>(ආ) අමාත්‍යාංශයෙන් පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් අමාත්‍යාංශ නියෝජිතයෙක් වූ අතර, ආයතනයේ |

| | |
|---|---|
| | සභාපතිවරයාද අමාත්‍යාංශ නියෝජිතයෙක් ලෙස සළකා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කර තිබුණි. |
| (ආ) 2006 ජාතික ප්‍රසම්පාදන වක්‍රලේඛය සමඟ නිකුත්කර ඇති ප්‍රසම්පාදන අත්පොතෙහි අතිරේක අංක 20 | ආයතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා රු.මිලියන 1.09 ක වටිනාකමකට ශ්‍රමය යුධ හමුදා 7 වෙනි ඉංජිනේරු රෙජිමේන්තුවෙන් ලබා ගැනිම සඳහා කටයුතු කර තිබුණද ඊට බලය දීම සම්බන්ධයෙන් විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු.4,482,528 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.4,597,886 ක ඌනතාවයක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,080,414 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ආදායම රු.26,389,806 ක් වූ අතර, එය සමස්ථ මෙහෙයුම් වියදම වූ රු.47,745,271 න් සියයට 55 ක මෙහෙයුම් වියදම් පමණක් ආවරණය කරගැනීමට හැකිවී තිබුණි. ආයතනයේ සමස්ථ ආදායමින් සියයට 42 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්ද, සියයට 30 ක් රජයේ ප්‍රදානයන්ගෙන්ද, ඉතිරි සියයට 28 වෙනත් ආදායම්වලින් ආවරණය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලසුම් කරන ලද පාඨමාලා හා වැඩසටහන් 53 කින් තථ්‍ය වශයෙන් පැවැත්වූ සංඛ්‍යාව 36 ක් වීමෙන් එය සියයට 67 ක ප්‍රතිශතයක් විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) වැවිලි ක්ෂේත්‍රයේ පුහුණුවන්නන් සඳහා අනුගත කිරිමේ 2011 පාඨමාලාවෙහි සිසුවකු ඌන සමාර්ථය ලබා තිබුණු අතර ඔහු 2012 වර්ෂයේදී පාඨමාලාව සම්පූර්ණ කර තිබුණි. එසේ වුවද 2013 සහතික ප්‍රදානෝත්සවයේදී ඔහු 2011 වර්ෂයේදී සමත් වූ ලෙස සලකා සහතිකපත ප්‍රදානය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය හා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ඒකාබද්ධව වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රය හා සම්බන්ධ විධායක නිලධාරින් හා වැවිලිකරුවන් සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ 2005 වර්ෂයේ දී ආරම්භ කරන ලද විද්‍යාවේ දී (වැවිලි කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව සම්බන්ධයෙන් ආයතනය හා විශ්ව විද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) ආයතනයේ අවසන් වරට සාමාජිකත්වය ලබාදුන් සාමාජිකයන්ගේ ලිපිගොනු පරීක්ෂාවේදී සාමාජික ලිපි ගොනු 08 ක අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කිරිමට අදාල සාක්ෂි

නොතිබීම හා සමහර ලිපි ගොනුවල තිබූ සහතිකපත්වල ඡායා පිටපත් සත්‍ය පිටපත් බවට තහවුරු කර නොතිබුණි.

(ඇ) ආයතනය පාඨමාලා සඳහා අයකරනු ලබන ගාස්තු තීරණය කිරීම සඳහා පදනම් කරගත් නිශ්චිත ක්‍රමවේදයක් නොවීය.

**4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

ආයතනය විසින් පවත්වනු ලබන වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (මොඩියුල 16 කින් යුක්ත) දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ පැවැත්වීම සඳහා මොඩියුල සකස් කිරිම වෙනුවෙන් තෝරාගත් සම්පත් දායකයන්ට 2011 වර්ෂයේ දී රු.450,000 ක වියදමක් දරා විවෘත විශ්ව විද්‍යාලයේ වැඩමුළුවක් පවත්වා තිබූ අතර, ඊට සහභාගිවීම වෙනුවෙන් ඔවුන්ට රු.232,500 ක ප්‍රවාහන දීමනාවක් 2012 වර්ෂයේ දී ගෙවා තිබුණි. එහෙත් 2014 මැයි 26 දක්වාම මෙම මොඩියුල සකස් කිරිම අවසන් වී නොතිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 39 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 31 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළවන අනුමත මාණ්ඩලික තනතුරු 05 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතිය ද, අනියම් පදනම මත කළමනාකරණ සහකාර තනතුරු 06 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් සඳහා සේවකයින් 09 දෙනෙකු බඳවා ගෙන තිබුණි. අනුමත නොවන කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වැටුප් හා අනෙකුත් දීමනා වෙනුවෙන් රු.2,067,198 ක් වැය කර තිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඇ) පාඨමාලා පැවැත්වීම